00245

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව 3 වන මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II - 2023/2024
LLU3406 - ව්‍යවස්ථා අර්ථ නිරූපන නීතිය.
කාලය - පැය එක (01) යි.

---

දිනය - 2025.01.09 වේලාව - ප.ව.1.30 - ප.ව.2.30 දක්වා

---

මුලු ප්‍රශ්න ගණන දෙකයි (02).

එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

අපේක්ෂකයින්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. ජාතික නීති ලීගය විසින් පවත්වනු ලබන ජාත්‍යන්තර නීති සම්මේලනයේ විද්වත් කථිකයෙකු වීමට සංවිධායක කමිටුව විසින් ඔබට ආරාධනා කර ඇත. සාකච්ඡාව සඳහා උප මාතෘකාව පාදක වන්නේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අර්ථනිරූපනය ඔස්සේ විවරවන මංපෙත්" යනුවෙනි.

සජීවී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රවේශය (Living Constitution Approach) කෙරෙහි අවධානය යොමුකරමින් සැසිය සඳහා ඉදිරිපත් කිරීමට ඔබේ කථාව සූදානම් කරන්න. අවම වශයෙන් අදාල නඩු තීරණ දෙකක් (02) උදාහරණ ලෙස භාවිතා කරමින් ඔබගේ විශ්ලේෂණය සකස්කළ යුතුය. (ලකුණු 20)

02. 2020 අංක 02 දරණ ශිෂ්‍ය හිංසන අවම කිරීමේ (පළාත් පාලන) පනතේ 02 වගන්තිය මෙසේ සඳහන් කරයි. "සතියේ දිනවල රාත්‍රී 11 න් පසුව ශිෂ්‍ය නේවාසිකාගාරයක් තුල සාදයක් සංවිධානය කිරීම වරදකි."

දෙවන වසර ඉගෙනුම ලබන ශිෂ්‍ය සංගමයේ සාමාජිකයෙකු වන ධීර් තම මිතුරන් සමඟ සිකුරාදා දිනක රාත්‍රී 10.30ට පමණ සමූහ සාකච්ඡාවක් සංවිධානය කළේය. ධීර්ගේ බොහෝ මිතුරන් නේවාසිකාගාරයට රැස්වූ අතර, සාකච්ඡාව දේශපාලන මතිමතාන්තර ආවරණය කරන්නාවූ විවාදයක් දක්වා වර්ධනය විය. ධීර් පීසා සහ සිසිල් බීම ඇණවුම් කළ අතර, රැස්වීම අවසන් වූයේ අලුයම 12.45ට පමණ වේ. මිතුරන් පිටත්ව යාමට පෙර පරිශ්‍රය පිරිසිදු කිරීමට ධීර්ට උදව් වූ මාෂී විශාල ශබ්දයක් නගවමින් වීදුරු බන්දේසියක් බිම හෙළීය. මෙම ශබ්දයෙන් අවදි වූ අසල්වැසි නිවසේ සිටි රූපා මේ සම්බන්ධව පොලීසියට පැමිණිලි කරන ලදී. පොලිස් විමර්ෂනවලින් අනතුරුව පනතේ 02 වගන්තිය යටතේ ධීර් චෝදනා ලැබීය.

ධීර් ඔබගේ උපදෙස් පතයි.

සාම්ප්‍රදායික ව්‍යවස්ථා අර්ථ නිරූපන රීති අදාල කරගනිමින් ධීර්ට උපදෙස් දෙන්න. ඔබගේ පැහැදිලි කිරීම නඩු තීරණ මඟින් සනාථ කළයුතු වේ.

(ලකුණු 20)

-සියලුම හිමිකම් ඇවිරිණි.-